# 1.29 ඵලදායිතාව හා 5එස් සංකල්පය දේශීය සාහිත්‍යයෙන් විවරණය වන අයුරු (ධර්මසේන හිමි විසින් රචිත සද්ධර්මරත්නාවලිය ඇසුරින්)

ඒ.එම්.එන්. හේමකුමාරි
නො 318, ජාතික ශ්‍රම අධ්‍යන ආයතනය, (කම්කරු සබදතා සහ මිනිස්බල අමාත්‍යාංශය),
හයිලෙවල් පාර, කොළඹ 06.

---

## ABSTRACT

දුරාතීතයේ පටන් මිනිසා කළමනාකරණය පිළිබදව උනන්දු වූ අතර කාර්මීකරණයත් සමග පවත්නා සීමිත සම්පත්වලින් උපරිම ලෙස ප්‍රයෝජන ගත යුතු බව අවබෝධ කර ගති. මෙහිදි ගෝලියකරණයත් සමග ජාත්‍යන්තර තරගයේ පිඩනයට පත්විමේ හේතුවෙන් ලෝක වෙළෙදපොලේ සිය තරගකාරී හැකියාව වැඩි කිරිම සදහා විවිධ ක්‍රමෝපායන් හා මතවාද ඉදිරිපත් විය. කළමනාකරණයෙ දී වැදගත් අංගයක් වශයෙන් ගැණෙන ඵලදායිතාවය පිළිබදව නවතම අදහස් ඉස්මතු වූ අතර එය පහසුවෙන් හා සරලව ක්‍රියාත්මක කිරිමේ ක්‍රමෝපායක් වශයෙන් ජපාන් ජාතික ටකායි අකිමොටෝ විසින් එස් පහ හදුන්වා දෙන ලදී. ලෞකික ජිවිතය සාර්ථක කර ගන්නට නොඑසේ නම් ඵලදායී කර ගැනිමට එස් පහ මෙවළමක් ලෙස භාවිතයට පැමිණියා මෙන් ම පරලොව ජිවිතය ඵලදායි කරගැනිමටත් මෙලොව දිවිය සරුකර ගන්නටත් බෞද්ධ දර්ශනයෙන් ලැබෙන පිටිවහල පිළිබදව අප විමර්ශනශිලීව බැලිය යුතුමය. මේ සදහා දඹදෙණි යුගයේදි ධර්මසේන හිමියන් අතින් විරචිත සද්ධර්මරත්නාවලිය මනා නිදසුනක් වන අතර මෙහිදී ඒ ආශ්‍රයෙන් කරුණු විමර්ශනය කිරිමට අපේක්ෂිතය.

ඵලදායිතාව පිළිබදව විවිධ අදහස් පළව ඇති අතර ඒවායෙහි මුලික අදහස කැටි කර ගත් කල යෙදවුම් හා නිපැයුම් අතර පවත්නා අනුපාතය ඵලදායිතාව ලෙස සරලව විග්‍රහ කළ හැකිය. එනම්, අප කිසියම් භාණ්ඩයක් හෝ සේවයක් ලබා ගැනිමට ඒ වෙනුවෙන් වැය කරන සම්පත් හා සේවාවන්ට වඩා එයින් ලැබෙන ප්‍රතිලාභ වැඩි විය යුතුය. සමස්තයක් වශයෙන් ගත් කල ධර්මසේන හිමියන් විසින් විරචිත සද්ධර්මරත්නාවලිය මගින් දෙයාකාරයකින් ජිවිතයේ සාඵල්‍යය ළගා කර ගත හැකි බව පැහැදිලි වේ. එනම් මෙහි එන අන්තර්ගතය ගත් කලල ජිවිතයේ විවිධ කැපකිරිම් හා දාන ශිල භාවනා ආදි පුණ්‍ය ක්‍රියාවන්හි යෙදීමෙන් ජිවිතයේ අභිවෘද්ධිය, එනම් අමිල වූ නිවන සාක්ෂාත් කර ගැනීමට හැකි බවට නිදර්ශන දක්වා තිබේ. එමෙන්ම එම කැප කිරිම මෙන්ම ජිවිත පරිත්‍යාගයෙන් කරන ලද කුසලයත් හේතු කොටගෙන මෙලොව පීවිතය සමෘද්ධියට පත් වේ. දහසකුත් එකක් කරදර බාදක විදදරා පීවිත පරිත්‍යාග නමැති යෙදවුම් කර, එමගින් පිවිතයේ අමිල ඵලය වූ බුද්ධත්වය නම් වූ උසස්ම ප්‍රතිලාභය ලැබූ චරිතයක් ලෙස ගෞතම බුද්ධ චරිතය හඳුන්වා දිය හැකිය. එනම්, ධර්මසේන හිමියන් පැහැදිලි ලෙස ප්‍රකාශ කරනුයේ,මෙලොව ජිවිතයේ විවිධ යෙදවුම් හා ඒ යෙදවුම් මගින් ලබා ගන්නා ඵලය මෙලොවදීත්, පරලොවදීත් මිල කල නොහැකි බවයි.

මෙම ක්‍රියාවලිය සම්පූර්ණ කිරිම සදහා ගත්නා උත්සාහය අපට දැරිය හැකි විය යුතුය. එය ඕනෑම තැනක ඕනෑම කෙනෙකුට අනුගත වීමට අවශ්‍ය පසුබිමක් සපයා දිය යුතුය. බෞද්ධ දර්ශනය ගත් කල නිවන සාදා ගැනිම සදහා බුදුන් නිර්දේශ කළේ මැදුම් පිළිවෙත යි. ඒ සදහා මනස සකස් කිරිමේ දි පහසු සරල ක්‍රම මගින් එය ජය ගැනීමේ මග කියා දුනි. ජපනුන් ඵලදායීතා ව ඇති කිරීම සදහා පංචවිධ සංකල්පය ක්‍රියාවට නැංවුවා මෙන්ම පීවිතය අර්ථවත් කර ගැන්මට අවශ්‍ය අත්වැල <u>සද්ධර්මරත්නාවලිය</u> මගින් සැපයෙන අයුරු විමසා බැලීම වටී.

සෙයිරි ( Seiri )මගින් අවශ්‍ය මොනවාද, අනවශ්‍ය මොනවාද යන්න සොයාබලා අනවශ්‍ය දේ ඉවත් කිරීම පැහැදිලි කර දී තිබේ. ජීවිතයේ නොනිමි ආශා නිමා කර නිරාමිස සුවය විඳීමට නම් අප ජීවිතයේ රාගාදීකුණු කන්දල් ඉවත් කළ යුතු බව ධර්මසේන හිමියන් මනාව පැහැදිලි කර ඇති ආකාරය සඳහා පෘථ.විසන්නිශ්‍රිත කථා කරන භික්ෂූන් වහන්සේලාගේ වස්තුව (344), සැරියුත් මහතෙරුන් වහන්සේගේමිත්‍ර බමුණන්ගේ කථාව හා (613). බහුභාණ්ඩික නම් තෙරුන් වහන්සේගේ වස්තුව(105). උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

සෙයිතෝන්(Seiton) මගින් සියලුම දේවල් සඳහා නිශ්චිත ස්ථානයක් ඇතිබවත් එමගින් කටයුතු පහසු වන බවත් ඒ සඳහා විවිධ ක්‍රමෝපායන් භාවිත කළ හැකි බවත් පැහැදිලි කෙරේ. මෙහි දී ධර්මසේන හිමියන් විධිමත් ලෙසත්, අර්ථවත් ලෙසත් ජීවිතය ගත කිරීමෙන් තුලින් ජීවිතය ආලෝකමත් වන බවටද කරුණු පැහැදිලි කරදී තිබේ උදාහරණ වශයෙන් මහාකාල තෙරුන් වහන්සේගේ කථාව හා (120), කුමුදුප්පලානිත දුග්ගත වස්තුව (438), දැක්විය හැකිය.

සෙයිසෝ(Seiso)මගින් පවිත්‍රතාව ඵලදායිතාවයේ අවශ්‍යම අංගයක්බව පැහැදිලි වන අතර ධර්මසේන හිමියන් නිවන් සාදා ගැනීම සඳහා මිනිසාගේ චිත්ත පාරිශුද්ධියේ වැදගත්කම පැහැදිලි කර ඇති බැව් සට්ඨිකූට ප්‍රේත වස්තුව (484), මහා කප්පින තෙරුන් වහන්සේගේ වස්තුව (515)හා කුණ්ඩධාන තෙරුන් වහන්සේගේ වස්තුව (689) ආදී කථා අනුසාරයෙන් පැහැදිලි කරගත හැකිය.

ඉහත දැක්වූ සෙයිරි, සෙයිතෝන්, හා සෙයිසෝ ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා කිසියම් ප්‍රමිතියක් පැවතිය යුතුවේ, සෙයිකිත්සු(Seiketsu) යනු එයයි. එනම්, ප්‍රමිතිය හා සම්මතකරණයයි. ධර්මසේන හිමියන් විසින් මෙලොව හා පරලොව සාර්ථක කර ගැනීමට මිනිසාට කිසියම් ගුණවගාවක් අවශ්‍ය බවත් ඒ සඳහා කිසියම් ආකාරයක ප්‍රමිතියක් පැවතිය යුතු බවත් මිරිගු කමටහන් කළ භික්ෂූන්වහන්සේගේ කථාවස්තුව (346),ධම්මික උපාසකගේ කථාවස්තුව (170), ගොධික තෙරුන් වහන්සේගේ වත (424), හා පන්සියදෙනා වහන්සේගේ කථාවස්තුව(547), වැනි කතා මගින් පැහැදිලි කර දී තිබේ.

ෂිත්සුකේ(Shitsuke) යනු, පුහුණුව හා විනයයි. ඒ මගින් ආයතනයේ ඵලදායිතාව අන් අයගේ අවධානයට ප්‍රශංසාවට ලක්වේ. පුහුණුව හා විනය ජීවිතයේ සාධු ධර්මයක්ව ඇති බැව් දීඝායු කුමාරයාගේ වත (614), කාළ නම් තෙරුන් වහන්සේගේ කථාවස්තුව (770)නෑයන්ගේ කළහය සිදුවූ වස්තුව(844)වැනි කතාවස්තුන්ගෙන් පැහැදිලි වේ.

මෙහිදී සියලු කරුණු සලකා බැලීමේදී ඵලදායී ජීවිතයකට මංපෙත් විදේශීය ආභාසයෙන් පමණක් නොවල දේශිය සාහිත්‍යයෙන්ද විවර කර ගත හැකි බැව් පැහැදිලිව පෙනෙන කරුණකි.